# ලංසු සඳහා ආරාධනයයි

## ධීවර අමාත්‍යාංශය

## උතුරු ප්‍රදේශයේ ධීවර කර්මාන්ත සංවර්ධනය
## මුලතිව් දිස්ත්‍රික්කය - අදියර 1

### කොන්ත්‍රාත් අංකය : MF/SD/PROC/PROC/09/2024/06

01. ධීවර අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දළ වශයෙන් රුපියල් මිලියන 97 ක (සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැය) ඇස්තමේන්තුගත පිරිවැයක් හා විස්තර කොට ඇති පරිදි උතුරු ප්‍රදේශයේ ධීවර සංවර්ධනය මුලතිව් දිස්ත්‍රික්කය - අදියර 1 සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

**ව්‍යාපෘතිය පිහිටි ස්ථානය : මුලතිව් දිස්ත්‍රික්කය**

**ව්‍යාපෘතියේ විස්තර :**

නිර්ණායකයන්, චිත්‍ර හා ප්‍රමාණ පත්‍රවල සඳහන් පරිදි දැල් අලුත්වැඩියා කරන ශාලාව, මැකඩම් (macadam) මාර්ග, හියුම් පයිප්ප, බෝක්කු සහ බොරළු පාරවල් ඉදිකිරීම හා සම්පූර්ණ කිරීම, කොන්ත්‍රාත් කාලසීමාව ලින් දින අනූවකි (90)

02. ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) (කලින් ICTAD) මහාමාර්ග ඉදිකිරීම් හා ගොඩනැගිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ සී 4 හෝ ඉහළ ශ්‍රේණියක වලංගු ලියාපදිංචියක් ලබා තිබීම.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතා :

- ලංසු භාරගැනීමේ අවසාන දිනයේ සිට පූර්වාසන්න වසර හතක් (07) තුළ ඉටුකරන ලද ඉදිකිරීම්, කර්මාන්තවල වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍යය අවම වශයෙන් රුපියල් මිලියන 146 ක් විය යුතුය.
- පසුගිය වසර හත් (07) තුළ රුපියල් මිලියන 68 ක අවම වටිනාකමක් සහිත යෝජිත කර්මාන්තයට සමාන ස්වභාවය හා සංකීර්ණත්වයෙන් යුතු අවම වශයෙන් එක් කර්මාන්තයක් මාස තුනක (03) කාලයක් තුළ සාර්ථකව සම්පූර්ණ කර තිබීම.
- මෙම කොන්ත්‍රාත්තුව යටතේ සිදුකරන ලද ඕනෑම අත්තිකාරම් ගෙවීමක් හැර අනෙකුත් කොන්ත්‍රාත්මය වගකීම් නොමැතිව තිබිය යුතු ද්‍රවශීල වත්කම් හා/හෝ ණය පහසුකම්වල අවම වටිනාකම රුපියල් මිලියන 76 ට අඩු නොවිය යුතු අතර, මාස තුනක කාලයක මුදල් ලැබීම් ලේඛනගත සාක්ෂි සහිතව ඉදිරිපත් කළ යුතුය.
- 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ අංක 8 වන වගන්තිය ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් සඳහා වන සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් (PCA-3) ලංසුකරු සතුව තිබිය යුතුය. මෙය කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකමකි.

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු කොළඹ 10, මාලිගාවත්ත, නව මහලේකම් කාර්යාලයේ 7 වන මහලේ, ධීවර අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (සමාජ සංවර්ධනය) වෙතින් ලබාගත හැකි අතර, 2024 මැයි 07 වෙනි දින සිට 2024 මැයි 27 වෙනි දින දක්වා ඕනෑම රාජකාරී දිනයක 09.00 පැය හා 15.00 පැය අතර, එම ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථන අංකය : 0112-440579, ජංගම : 0717-440862, ෆැක්ස් : 0112-322416, ඊමේල් ලිපිනය : social@fisheries.gov.lk

06. ධීවර අමාත්‍යාංශයේ 7 වන මහලේ පිහිටි සංවර්ධන අංශය වෙත ආපසු ගෙවනු නොලබන රුපියල් දෙලොස් දහස් පන්සියයක (රු. 12,500.00) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2024 මැයි 07 වෙනි දින සිට 2024 මැයි 27 වෙනි දින දක්වා 09.00 පැය හා 15.00 පැය අතර කොළඹ 10, මාලිගාවත්ත, නව මහලේකම් කාර්යාලයේ ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් ක්‍රමය මුදලින් හෝ බැංකු අණකරයක් මගිනි.

07. ලංසු පිටපත් දෙකකින් යුතුව, 2024 මැයි 28 වෙනි දින 14.00 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි **"ලේකම්, ධීවර අමාත්‍යාංශය, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10"** යන ලිපිනය සඳහන් කර ධීවර අමාත්‍යාංශයේ 7 වන මහලේ පිහිටි සංවර්ධන අංශය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

08. ලංසු 2024 අගෝස්තු 27 වෙනි දින දක්වා (දින 91ක්) වලංගු විය යුතුය.

09. සියලුම ලංසු සමග රුපියල් නව ලක්ෂ හැත්තෑ දහසක් (රු. 970,000.00) වටිනා 2024 සැප්තැම්බර් 24 වෙනි දින දක්වා වලංගු කොළඹ 10, මාලිගාවත්ත, නව මහලේකම් කාර්යාලයේ, ධීවර අමාත්‍යාංශ ලේකම් නමින් ලංසු ලිපිලේඛනයේ 9 වන කොටසේ - සම්මත ආකෘති (ලංසු ඇපකරය) ඇතුළත් කොට ඇති ආකෘතියේ ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. ලංසු ඇපකරය, ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ රට තුළ ක්‍රියාත්මක වන බලයලත් වාණිජ බැංකුවක් විසින් නිකුත් කොට තිබිය යුතුය.

10. පූර්ව වැඩ බිම් සංචාරය 2024 මැයි 17 වෙනි දින පැවැත්වේ.

11. පූර්ව ලංසු රැස්වීමක් පහත සඳහන් ආකාරයෙන් පැවැත්වේ.

**දිනය හා වේලාව : 2024 මැයි 20 වෙනි දින 14.00 පැයේදී.**

**ස්ථානය : ශ්‍රවණාගාරය,**
**5 වන මහල, ධීවර අමාත්‍යාංශය,**
**නව මහලේකම් කාර්යාලය,**
**මාලිගාවත්ත, කොළඹ 10.**

12. නොගැලපීම් මග හරවා ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට පෙර ICTAD/SBD/01 හි ITB දෙවන සංස්කරණය - ජනවාරි 2007 හා 2009 ඔක්තෝබර් මාසයේ හා 2011 පෙබරවාරි මාසයේ නිකුත් කරන ලද අතිරේක හොඳින් කියවා බලන මෙන් සියලුම ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**උතුරු ප්‍රදේශයේ ධීවර කර්මාන්ත සංවර්ධනය,**
**ධීවර අමාත්‍යාංශය, 2 වන මහල,**
**නව මහලේකම් කාර්යාලය,**
**මාලිගාවත්ත,**
**කොළඹ 10.**